ප්‍රවෘත්ති අධ්‍යක්ෂ /ප්‍රවෘත්ති සංස්කාරක 2018 සැප්තැම්බර් 21

# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013 = 100) : 2018 අගෝස්තු

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය

දුරකථනය: 011-2147414 ෆැක්ස්: 011-2877945 ඊමේල්: prices@statistics.gov.lk

ජාතික පාරිභෝගික මිල දර්ශකය නිකුත් කරමින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ වැඩබලන අධ්‍යක්ෂ ජනරාල්, 2018 අගෝස්තු මාසයේ ලක්ෂ්‍යමය උද්ධමනය 2.5%ක් බව ප්‍රකාශ කලේය. පසුගිය ජූලි මාසයේ ලක්ෂ්‍යමය උද්ධමනය 3.4%ක් ලෙස වාර්තා විය. අගෝස්තු මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ -0.01%ක හා ආහාර නොවන කාණ්ඩයේ 2.57%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. එහෙත් 2017 අගෝස්තු මාසයේ 7.9% ක්වූ උද්ධමනයට ආහාර කාණ්ඩයේ දායකත්වය 5.3%ක් හා ආහාර නොවන කාණ්ඩයේ දායකත්වය 2.7%ක් විය.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ මාසික වෙනස්වීම සංසන්දනය කලවිට, 2018 ජූලි මාසයේ 126.6ක් වූ දර්ශකාංකය 2018 අගෝස්තු මාසයේ 125.4ක් දක්වා පහළ යාමක් වාර්තා විය. පසුගිය මාසය හා සංසන්දනය කලවිට 2018 අගෝස්තු මාසයේ දර්ශකාංකය 1.2ක අඩුවීමක් එනම් 0.9ක ප්‍රතිශතකාංක අඩුවීමක් වාර්තා විය. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම 1.31%කින් අඩුවීම හා ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.40%කින් වැඩිවීම දායක වී ඇත.

ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම අඩුවීම සඳහා එළවළු, පොල්, අමු මිරිස්, අළුත් මාළු, රතුළූණු, සහල්, දෙහි, මයිසූර් පරිප්පු, සුදුළූණු, අර්තාපල්, සීනි, ඉඟුරු, මිරිස් කුඩු සහ කඩල යන ආහාර ද්‍රව්‍යවල මිල අඩුවීම බලපා ඇත. එසේ වුවත් පැපොල්, බිත්තර, අඹ, කිරිපිටි, කෙසෙල්, කරවල, කුකුල් මස්, අන්නාසි සහ තේ කොළ යන ආහාර ද්‍රව්‍යවල මිල වැඩිවීමක් වාර්තා වී ඇත.

පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 2018 අගෝස්තු මාසයේ ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම වැඩිවීම සඳහා ‘මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය’, 'ප්‍රවාහන', 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන', ‘ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු', ‘විවිධ භාණ්ඩ හා සේවා’, ‘විනෝදාත්මක හා සංස්කෘතික’, 'ආපනශාලා සහ හෝටල්' සහ ‘රෙදිපිළි හා පාවහන්’, යන කාණ්ඩවල වියදම්වල වටිනාකම වැඩිවීම බලපා ඇත. එසේ වුවත් පසුගිය මාසය හා සංසන්දනය කලවිට ‘සෞඛ්‍ය' කාණ්ඩයේ වියදම්වල වටිනාකම අඩුවීමක් වාර්තා විය. තවද පසුගිය මාසය හා සංසන්දනය කළවිට 'සන්නිවේදන' සහ ‘අධ්‍යාපන’ යන කාණ්ඩවලට අයත් කිසිඳු අයිතමයක මිලෙහි වෙනසක් වාර්තා නොවීය.




**ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2013 = 100)**

| වර්ෂය | මාසය | දර්ශකාංකය | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | ලක්ෂ්‍යමය උද්ධමනය (%) |
|---|---|---|---|---|
| **2017** | අගෝස්තු | 122.3 | -0.1 | 7.9 |
| | සැප්තැම්බර් | 123.3 | 0.8 | 8.6 |
| | ඔක්තෝම්බර් | 124.8 | 1.2 | 8.8 |
| | නොවැම්බර් | 126.4 | 1.3 | 8.4 |
| | දෙසැම්බර් | 126.6 | 0.2 | 7.3 |
| **2018** | ජනවාරි | 125.8 | -0.6 | 5.4 |
| | පෙබරවාරි | 123.7 | -1.7 | 3.2 |
| | මාර්තු | 122.8 | -0.7 | 2.8 |
| | අප්‍රේල් | 122.9 | 0.1 | 1.6 |
| | මැයි | 124.3 | 1.1 | 2.1 |
| | ජූනි | 126.5 | 1.8 | 2.5 |
| | ජූලි | 126.6 | 0.1 | 3.4 |
| | අගෝස්තු | 125.4 | -0.9 | 2.5 |

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව